# කොළඹ මහා නගර සභාව

## 2021/04 වන කාර්තුවේ වරිපනම් බදු ගෙවීමේ අවසාන දිනය, 2022/01 වන කාර්තුව සඳහා 5% වට්ටම් ලබා ගැනීම සහ 2022 කාර්තු හතරට අදාළ සම්පූර්ණ වරිපනම් මුදල එකවර ගෙවා 10% වට්ටම් ලබා ගැනීම

**2021/04 වන කාර්තුව**

1. 2021/04 වන කාර්තුව සඳහා ගෙවිය යුතු වරිපනම් බදු 2021 දෙසැම්බර් මස 31 වන දින හෝ ඊට පෙර මෙම කාර්යාලයට ලැබිය යුතුය.
2. 2021/12/31 දිනට පසුව 2021/04 වන කාර්තුව සඳහා කරන ගෙවීම් වෙනුවෙන් නේවාසික දේපළ සහ මුඩුබිම් සඳහා කාර්තුවේ වරිපනම් බදු වටිනාකමින් 15% ක්ද සෙසු දේපළ සඳහා 20% ක්ද වශයෙන් වරෙන්තු ගාස්තු අයකරනු ලැබේ.

**2022 සියලුම කාර්තු /2022/01 වන කාර්තුව**

3. 2022 ජනවාරි මස 31 දින හෝ ඊට පෙර 2022 සියලුම කාර්තු වෙනුවෙන් කරන ගෙවීම් සඳහා වර්ෂයේ මුළු වරිපනම් බදු වටිනාකමින් 10% ක් වට්ටම් ලෙස ලබාදෙනු ඇත.
4. 2022 ජනවාරි මස 31 දින හෝ ඊට පෙර 2022/01 වන කාර්තුව වෙනුවෙන් කරන ගෙවීම් සඳහා කාර්තුවේ වරිපනම් බදු වටිනාකමින් 5% ක වට්ටම් ලෙස ලබාදෙනු ඇත.

**වරිපනම් බදු ගෙවීම් කළ හැකි ආකාර**

5. නගර සභා පරිශ්‍රයේ පිහිටා ඇති වරිපනම් කවුළු හා සරප් කවුළු සතියේ සෑම රාජකාරී දිනකම සහ රජයේ නිවාඩු දිනයන් නොවන සෙනසුරාද දිනයන්හි පෙ.ව. 8.30 සිට ප.ව. 4.00 දක්වා විවෘතව පවතී. සරප් කවුළු වෙත මුදල්, චෙක්පත්, ණයකාඩ් පත් (Credit card) මගින් ගෙවීම් කිරීමේ පහසුකම් සලසා ඇත.
6. කොළඹ නගර සීමාව තුළ පිහිටි ලංකා බැංකු සහ මහජන බැංකු ශාඛා (පුරහල ශාඛාව හැර) මගින් වරිපනම් බදු ගෙවීම කළ හැකි අතර එහිදී නගර සභාව විසින් බැංකුව වෙත සපයා ඇති ආකෘති පත්‍ර පමණක් භාවිතා කර වරිපනම් බදු ගෙවිය යුතු වේ. නියමිත ආකෘති පත්‍රය භාවිතා නොකිරීම හා ආකෘති පත්‍රයෙහි සඳහන් කළ යුතු සියලු කරුණු නිවැරදිව සම්පූර්ණ නොකිරීම යන හේතූන් මත මුදල් නිසි පරිදි ගිණුම්ගත නොවීම සම්බන්ධව නගර සභාව වග කියනු නොලැබේ.
7. කොළඹ මහා නගර සභාවේ නිල වෙබ් අඩවිය වන www.colombo.mc.gov.lk හරහා සේවා ගාස්තු අය කිරීමකින් තොරව මාර්ගගත ක්‍රමය (online) ඔස්සේ වරිපනම් බදු ගෙවීමේ පහසුකම් සලසා ඇත.
8. කොළඹ මහ නගර සභාවට අයත් පහත සඳහන් කාර්යාලයේ ස්ථාපිත කර ඇති වරිපනම් කවුළු හා සරප් කවුළු මගින් සතියේ සෑම රාජකාරි දිනකම පෙ. ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා වරිපනම් බදු ගෙවීමට පහසුකම් සලසා ඇත.

   I. **දිසා කාර්යාලය අංක 4- රොබට් ගුණවර්ධන මාවත, කිරුළපන**

9. කොමර්ෂල් බැංකුවේ ගිණුමක් හිමි බදු ගෙවන්නන් හට අන්තර්ජාලය ඔස්සේ කොළඹ මහා නගර සභාව වෙත වරිපනම් බදු ගෙවීමේ පහසුකම පවතී.

   චෙක්පත් මගින් වරිපනම් බදු ගෙවීමේදී පහත කරුණු පිළිබඳ සැලකිලිමත් විය යුතුය.

10. **"නාගරික භාණ්ඩාගාරික, කොළඹ මහා නගර සභාව"** නමට චෙක්පත ලිවිය යුතු අතර **"ආදායකයාගේ ගිණුමට පමණයි"** යනුවෙන් රේඛණය කළ යුතුය.
11. සෑම චෙක්පතකම පිටුපස
    - (අ) වරිපනම් ගිණුම් අංකය
    - (ආ) ගෙවන්නාගේ නම සහ ලිපිනය
    - (ඇ) දේපළ අංකය, වීදිය, කොට්ඨාසය
    - (ඈ) ගෙවීම් කරනු ලබන්නේ කුමන කාර්තුවක් සඳහාද යන්න සඳහන් කළ යුතුය.
12. චෙක්පත උපලබ්ධි වීමෙන් පසු නිල කුවිතාන්සිය නිකුත් කරනු ලැබේ.

**වෙනත් කරුණු**

13. තැපැල් මගින් එවනු ලබන චෙක්පත්, බැංකු ස්ථාවර නියෝග මත කරන ගෙවීම් ඉහත අංක 1, 3 හා 4 හි සඳහන් නියමිත දින හෝ එදිනට පෙර මෙම කාර්යාලයට ලැබෙන පරිදි **නාගරික භාණ්ඩාගාරික, නාගරික භාණ්ඩාගාරික දෙපාර්තමේන්තුව, කොළඹ මහා නගර සභාව, තැ.පෙ. 108, නගර ශාලාව, කොළඹ 07** යන ලිපිනයට යොමු කළ යුතුය.
14. වරිපනම් බදු සම්බන්ධ විමසීම්

| | | |
|---|---|---|
| **දුරකථන අංක** | : | **011 2693136, 0114360847 (ගණකාධිකාරී - වරිපනම්)** |
| **විද්‍යුත් තැපෑල** | : | acc02@colombo.mc.gov.lk/acc07@colombo.mc.gov.lk |
| **වෙබ් අඩවිය** | : | www.colombo.mc.gov.lk |

**නීතිඥ රෝෂණී දිසානායක**
**නාගරික කොමසාරිස්,**
**කොළඹ මහා නගර සභාව.**